සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 15 S I

නම: .............................................

# බුද්ධ ධර්මය

කාලය පැය එකයි

## I කොටස

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වලදී 1,2,3,4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01) සිදුහත් බෝසතාණන් වහන්සේගේ ප්‍රථම සිංහනාදය වන්නේ,
1. " සබ්බ පාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා" යන්නයි.
2. " අග්ගෝ හමස්මි ලෝකස්ස - ජෙට්ඨෝ හමස්මි ලෝකස්ස" යන්නයි.
3. " අනේකජාති සංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං " යන්නයි.
4. " අප්පමාදෝ අමතපදං - පමාදෝ මච්චුනෝ පදං " යන්නයි.

02) බුදුරජාණන් වහන්සේ කායිකව රෝගී වූ අය සුවපත් කළ අවස්ථා ගණනාවක් සූත්‍ර ධර්ම වල දැක්වේ. ඒ අනුව "සත්ත බොජ්ඣංග සූත්‍ර දේශනාව දේශනා කරමින් සුවපත් කළ රහතන් වහන්සේ නමක් වන්නේ,
1. සැරියුත් මහ රහතන් වහන්සේ
2. අනුරුද්ධ මහ රහතන් වහන්සේ
3. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ
4. අස්සජි මහ රහතන් වහන්සේ

03) විවිධ අන්තගාමී මතිමතාන්තර හෙවත් දෘෂ්ටි වාද කරපින්නාගෙන සිටි මහණ බමුණන් ආදීන් බුද්ධ ශ්‍රාවකයින් බවට පත්කරලීමට බුදුරජාණන් වහන්සේට හැකිවිය. ඒ තුළින් ප්‍රකට වන්නේ උන්වහන්සේ තුළ පැවති,
1. පුරිස දම්ම සාරථී ගුණය යි. 2. මහා කරුණාව යි. 3. අසරණ සරණ ගුණය යි. 4. තාදී ගුණය යි.

04) අනුන් මට දොස් කියතොත් එයට ඔබ කෝප නොවිය යුතුය. අසතුටු නොවිය යුතුය. බුදු රජාණන් වහන්සේ මෙම ප්‍රකාශය කිරීමට හේතු වූ කරුණ වන්නේ,
1. සුප්පියා හා සෝණදණ්ඩගේ කතාබහක් නිසාය.
2. බ්‍රහ්මදත්ත හා උපකගේ කතාබහක් නිසාය.
3. සුප්පියා හා තෝදෙය්‍යගේ කතාබහක් නිසාය.
4. සුප්පියා හා බ්‍රහ්ම දත්තගේ කතාබහක් නිසාය.

05) බුදුරජාණන්වහන්සේගේ අනුශාසනය පරිදි බඹරා මල නොතලා රොන් ගන්නාක් මෙන් භික්ෂූන් වහන්සේද සමාජයට බරක් නොවන ආකාරයෙන් සැදැහැවතුන්ගෙන්,
1. ගරු සම්මාන ලබාගත යුතු ය.
2. සිවුපසය ලබාගත යුතු ය.
3. පින් ලබාගත යුතු ය.
4. මුදල් ලබාගත යුතු ය.

06) බුදුරජාණන් වහන්සේට අනාථපිණ්ඩික සිටුවරයා හා විශාඛා උපාසිකාව විසින් පූජා කළ ආරාම දෙක වන්නේ,
1. ජේතවනාරාමය හා පූර්වාරාමයයි.
2. පූර්වාරාමය හා නිග්‍රෝධාරාමයයි.
3. කලන්දක නිවාපය හා පූර්වාරාමයයි.
4. ජීවක අඹවනය හා ජේතවනාරාමයයි.

07) බුදුරජාණන් වහන්සේ සසර දුකට ප්‍රතිකාර කරන උසස් වෛද්‍ය වරයෙකු බවට පෙන්වාදෙමින් පද රචනය වූ අගනා කෘතිය වන්නේ,
1. සියබස්ලංකාරයයි. 2. ථූපවංශයයි. 3. ලෝවැඩ සඟරාවයි. 4. බුදුගුණ අලංකාරයයි.

08) භද්දාලි සූත්‍රයෙහි දැක්වෙන පරිදි " ආහාරෙ මත්තඤ්ඤුතා" හෙවත් ප්‍රමාණය දැනගෙන ආහාර අනුභව කිරීමෙන් ලැබෙන යහපත් ප්‍රතිඵලයක් නොවන්නේ,
1. සුව පහසු පැවැත්ම. 2. සැහැල්ලු පැවැත්ම 3. නිදුක් බව. 4. රෝගාබාධ වැඩිවීම.

09) පත්ත කම්ම සූත්‍රයෙහි සඳහන් බලි සංකල්පයෙහි එන " පුබ්බ පේත බලි" යන්නෙහි අර්ථය වන්නේ,
1. දෙවියන් උදෙසා සත්ත්ව බිලි පූජා පැවැත්වීම අනිවාර්යය බවයි.
2. මියගිය ඥාතීන් වෙනුවෙන් පින් පෙත් දීම යන්නයි.
3. රජයට යුතුකම් ඉටුකිරීම යන්නයි.
4. ආගන්තුකයන් වෙනුවෙන් සිදුකරනු ලබන යුතුකම් ඉටුකිරීමයි.

10) බෝසත්වරු තණ්හාවෙන් මානයෙන් හා මිථ්‍යාදෘෂ්ටියෙන් මිදී කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුතුව, පංචකාම සම්පත්තියෙන් ඉවත්වීම ප්‍රකට කෙරෙන්නේ,
1. දාන පරමිතාවයි. 2. සීල පාරමිතාවයි.
3. නෙක්ඛම්ම පාරමිතාවයි. 4. උපේක්ෂා පාරමිතාවයි.

11) පාරමිතා සම්පූර්ණ කිරීමේදී මෛත්‍රී සහගත කායකර්මයෙන්, මෛත්‍රී සහගත වචී කර්මයෙන්, මෛත්‍රී සහගත මනෝ කර්මයෙන් යුතුව ක්‍රියාකරනු ලබයි. අප බෝසතාණන් වහන්සේ මෙම පාරමිතා සම්පූර්ණ කළ බව දැක්වෙන ජාතක කතාවක් වන්නේ,
1. මහා කපී ජාතකය 2. වට්ටක ජාතකය 3.ලෝමහංස ජාතකය 4. තේමිය ජාතකය

12) ස්වභාවික පරිසරයට දම්සභා මණ්ඩපයක් බවට පත්කරගන්නා අවස්ථා බොහෝමයක් බුදුසිරිතෙන් ප්‍රකට කෙරේ. ඒ අනුව උන්වහන්සේ අම්බට්ඨ සූත්‍රය දේශනා කළේ.
1. ගිජ්ඣකූට පර්වතයෙහි සූකරකත ලෙනේදී ය. 2. ඉසිපතන මිගදායේදී ය.
3. ජීවක අඹවනයේදී ය. 4. ඉච්ඡානංගල වනයේදී ය.

13) අවිධිමත් ලෙස, ගිජු ලෙස අවිධිමත් ලෙස, ගිජු ලෙස ආහාර අනුභව කරන්නන්, පස්දෙනෙකු පිළිබඳව බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වේ. ඒ අනුව නැගිට ගැනීමටත් බැරි තරමට කෑම ගෙන එහිම පෙරලී සිටින තැනැත්තා හඳුන්වනු ලබන්නේ,
1. හුත්තවම්තක 2. කාකමාසක 3. තත්ථා වට්ටක 4. අලංසාටක

14) මිනිස් සිතෙහි ස්වභාවය හා සිත දමනය කර ගැනීමෙන් සිදුවන යහපත යහපත පිළිබඳව දේශනා කළ ධම්මපද ගාථාවේ මුල්පද දෙක වනුයේ,
1. " අසාරේ සාරමතිනො - සාරේවා සාර දස්සිනෝ" 2. "දූරංගමං ඒකචරං - අසරීරං ගුහාසයං"
3. " අක්කොච්ඡිමං අවධිමං - අජිනිමං අහාසිමෙ" 4. අචරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනේ ධනං"

15) ලෝකය, සත්ත්වයා යැයි කියනු ලබන ස්කන්ධ ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් දැන කරනු ලබන භාවනාව,
1. විපස්සනා භාවනාවයි. 2. සමථ භවනාවයි. 3. අනාපානාසති භාවනාවයි. 4. පිළිකුල් භාවනාවයි.

16)ආනන්ද, අනුරුද්ධ දේවදත්ත ආදී ශාක්‍ය කුමාරවරුන් බුදුරජාණන් වහන්සේ වහන්සේ වෙතින් පැවිද්ද බව ලැබුවේ,
1. ඉසිපතනාරාම මිගදායේදීය. 2. අචිරවතී නදියෙහි පිහිටි අඹවනයේදී ය.
3. විශාලා මහනුවර කූටාගාර ශාලාවේදී ය. 4. අනෝමා නදී තීරයේදී අනුපිය අඹවනයේදීය.

17) සාමඤ්ඤඵල සූත්‍රයේ පෙන්වා දෙන පරිදි, ණයගැතියෙකු ණය හිමිට යම් බැඳීමක් ඇතිද එවිට වහලෙකු මෙන් යටත්වන බවයි. පංචනීවරණවලදී මෙය හඳුන්වන්නේ,
1. කාමච්ඡන්ද නීවරණයයි. 2. ථීන මිද්ධ නීවරණයයි. 3. ව්‍යාපාද නීවරණයයි. 4. විචිකිච්ඡා නීවරණයයි.

18) තෝදෙය්‍යය පුත්‍ර සුභ මානවකයා මුල් කරගෙන මෙලොව දක්නට ලැබෙන විසමතා 14ක් පිළිබඳව කරුණු දක්වා දේශනා කරන්නට යෙදුන සූත්‍ර ධර්මය වන්නේ,
1. පරාභව සූත්‍රයයි. 2. චූල්ලකම්ම විභංග සූත්‍රය
3.අනන්ත ලක්ඛණ සූත්‍රය 4. වේදනා පරිග්ගහ සූත්‍රය

19)අකුසල් මොනවාද කුසල් මොනවාද සත්‍යය අසත්‍යය කුමක්දැයි පිළිබඳව විමසීම් කරන්නා,
1. මහා භෝගීව උපදී 2. උසස් යැයි සම්මත කුලවල උපදී
3. ප්‍රඥාවන්තව උපදී 4. වර්ණවත්ව උපදී

20) උපතිස්ස කෝලිත දෙදෙනාගේ මුල් ආචාර්යවරයා,
1. සංජය පිරිවැජියාය. 2. උපක ආජීවකයාය. 3. පොට්ඨපාද පිරිවැජියාය. 4. සෝණදණ්ඩ පිරිවැජියාය.

21) " යම් බීජයක් වපුරා ඒ අනුව ඵලය ලබයි. යහපත් ක්‍රියා තුළින් යහපත් විපාක ලබයි. මෙම අදහස දැක්වෙන ගාථාවේ මුල් දෙපදය වනුයේ,
1. " සද්ධා බීජං තපෝ වුට්ඨී - පඤ්ඤා මේ යුග නංගලං"
2. සද්ධාය තරති ඕඝං - අප්පමාදේන අණ්ණවං"
3. " අප්පමාදෝ අපතපදං - පමාදෝ මච්චුනෝ පදං"
4. " යාදිසං වපතේ බීජං - තාදිසං හරතේ ඵලං"

22) ත්‍රිශික්ෂාවේ ප්‍රඥා ශික්ෂාවට අයත්වන මාර්ගාංගයක් වන්නේ කුමක්ද?
1. සම්මා වාචා 2. සම්මා සංකප්ප 3. සම්මා ආජීව 4. සම්මා වායාම

23)මෙලොවදීම විපාක දෙන කුසල කර්ම හඳුන්වන්නේ,
1. අහෝසි කර්ම ලෙසය. 2. අපරාපරිය කර්ම ලෙසය.
3. දිට්ඨධම්ම වේදනීය කර්ම ලෙසය. 4. උපපජ්ජවේදනීය කර්ම ලෙසය.

24) ලොව සියල්ල මොහොතින් මොහොත වෙනස්වන බව ස්ථිරසාරව නොමැති බව කැඩෙන බිඳෙන සුළු බව බුදු දහමෙහි දැක්වෙන්නේ,
1. අනිත්‍යය වශයෙනි. 2. දුක්ඛ වශයෙනි. 3. උපාදාන වශයෙනි. 4. නිත්‍ය වශයෙනි.

25) " වේදනා නොමැතිවීමෙන් තණ්හාව නැතිවේ. යන්න සඳහන් පටිච්ච සමුප්පාද පාඨය කුමක්ද?
1. නාමරූප නිරෝධා සළායතන නිරෝධෝ 2. උපාදාන නිරෝධා භව නිරෝධෝ
3. තණ්හා නිරෝධා උපාදාන නිරෝධෝ 4. වේදනා නිරෝධා තණ්හා නිරෝධෝ

26)" දිළින්දන්ට ධනය ලැබීමෙන් දිළිඳුකම නැතිවේ. යනාදි වශයෙන් සමාජ ප්‍රශ්න විසඳන ක්‍රමය පැහැදිලි කරමින් දේශනා කළ සූත්‍ර ධර්මය කුමක්ද?
1. බ්‍රහ්මජාල සූත්‍රයයි. 2. චක්කවත්ති සීහනාද සූත්‍රයයි.
3. සාමඤ්ඤඵල සූත්‍රයයි. 4. චූල්ලකම්ම විභංග සූත්‍රයයි.

27) රාජ්‍ය පාලනය පිළිබඳව බෞද්ධ ආකල්ප කිහිපයක් පහත දැක්වේ.
A. පාලකයා සදාචාර සම්පන්න අයෙකු විය යුතු ය.
B. පසිඳුරන් පිනවීමට ගිජු නොවී ක්‍රියාකළ යුතු ය.
C. රාජ්‍ය පාලකයන් සමගිව ක්‍රියාකළ යුතු ය.
D. ආර්ථික සුරක්ෂිතතාව තහවුරු කළ යුතු ය.

මෙම ප්‍රකාශ ඇසුරෙන් දසරාජ ධර්ම වලට අයත් ප්‍රකාශ ඇතුළත් වරණය තෝරන්න.
1. A හා C පමණි. 2. A, B හා D පමණි. 3. B,C හා D පමණි. 4. C හා D පමණි.

28)සම්මා දිට්ඨී යනු නිවැරදි දැකීමයි. අටුවාවල සම්මාදිට්ඨී පස් ආකාරයකින් විස්තර කරයි. එහි දී තමන් කරන ක්‍රියාවන්හි විපාක තමන් කරා පැමිණෙන බව දැකීම.
1. කම්මස්සකතා සම්මා දිට්ඨීයයි. 2. ධ්‍යාන සම්මා දිට්ඨීයයි.
3. විදර්ශනා සම්මා දිට්ඨීයයි. 4. ඵල සම්මා දිට්ඨීයයි.

29)උට්ඨාන වීර්යයෙන් දෑතේ මහන්සියෙන් දහඩිය වගුරුවා ධාර්මික ව සපයා ගත් ධනය පරිභෝග කිරීමෙන් ලබන සැපය හඳුන්වනු ලබන්නේ,
1. භෝග සුඛය නමිනි. 2. අත්ථි සුඛය නමිනි. 3. උට්ඨාන සුඛය නමිනි. 4. අනවජ්ජ සුඛය නමිනි.

30) කුරුණෑගල රාජධානි සමයේ විද්‍යා චක්‍රවර්ති පරාක්‍රම පණ්ඩිත නම් තැනැත්තෙකු විසින් රුවන්වැලි මහ සෑ රදුන්ගේ විස්තර ඇතුළත් කරමින් රචනා කරන ලද ග්‍රන්ථය කුමක්ද?
1. බෝධි වංශය 2. උම්මග්ග ජාතකය 3. ථූප වංශය 4. එළු අත්තනගළු වංශය

31) බුද්ධ පරිනිර්වාණයේ පටන් ශාසන මාමක භාණක තෙරුන් විසින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන ආ ත්‍රිපිටක ධර්මය ග්‍රන්ථාරූඪ කිරීම සිදුවූයේ,
1. දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ අනුරාධපුරයේදීය.
2. වළගම්බා රාජ්‍ය සමයේ මාතලේ අලුවිහාරයේදීය.
3. මහා පරාක්‍රම බාහු රාජ්‍ය සමයේ පොළොන්නරුවේදීය.
4. හතරවන මහා පරාක්‍රම බාහු රාජ්‍ය සමයේ දඹදෙණියයේදීය.

32) බුද්ධ ප්‍රතිමා කලාව ආරම්භ වූ පසු විවිධ මාධ්‍යය උපයෝගී කරගෙන බුද්ධ ප්‍රතිමා නිර්මාණය විය. අනාබද්ධ හිටි බුද්ධ ප්‍රතිමාවක් සඳහා කදිම උදාහරණයක් ලෙස පෙන්වාදිය හැකි බුද්ධ ප්‍රතිමාව,
1. අවුකන බුද්ධ ප්‍රතිමාවයි.
2. රැස්වෙහෙර බුද්ධ ප්‍රතිමාවයි.
3. ගල්විහාර බුද්ධ ප්‍රතිමාවයි.
4. මාළිගාවිල බුද්ධ ප්‍රතිමාවයි.

33) සත්ත සතිකා සයගීතිය නමින් හැඳින්වෙන්නේ,
1. දෙවන ධර්ම සංගායනාවයි.
2. පළමු ධර්ම සංගායනාවයි.
3. තෙවන ධර්ම සංගායනාවයි.
4. සිව්වන ධර්ම සංගායනාවයි.

34) " මාගේ මේ ව්‍යායාමය බුද්ධ සාසනයේ චිරස්ථිතිය පිණිස මිස රජසැප පිණිස නොවේ. යනුවෙන් ප්‍රකාශ කළ රාජ්‍ය පාලකයා වනුයේ,
1. සද්ධාතිස්ස රජතුමාය.
2. විජයබාහු රජතුමාය.
3. දුටුගැමුණු රජතුමාය.
4. මහසෙන් රජතුමාය.

35) පුබ්බේ නිවාසානුස්සති ඥානයෙන් හා චුතූපපාත ඥාණයෙන් වඩාත්ම කියවෙනුයේ,
1. කර්මය හා කර්ම විපාක පිළිබඳව දැනුමයි.
2. සත්ත්වයාගේ පෙරභවයේ පැවැත්ම හා මතුභවයේ පැවැත්මයි.
3. ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවල යෙදීමෙන් ලැබෙන ප්‍රතිඵලයයි.
4. මරණින් පසු ලැබෙන විපාක ශක්තියයි.

36) රාජ්‍ය පාලකයෙකු සතර අගතියෙන් තොරව රාජ්‍ය පාලනය කළ යුතු ය. නිවැරදිව සතර අගතිය දක්වා ඇති වරණය වන්නේ,
1. ඡන්දය, ප්‍රියවචනය, මුදිතාව, මෝහනයයි.
2. ද්වේශය, අර්ථචර්යාව, භය මෝහයයි.
3. අර්ථචර්යාව, දානය, ඡන්දය, ද්වේශයයි.
4. ඡන්දය, ද්වේශය, භය මෝහයයි.

37) " කවරෙකුට නම් දිවා රාත්‍රී පින් වැඩේද? කවරෙක් නම් සුගතියට යත්ද? යනුවෙන් එක්තරා දේවතාවෙක් බුදුරජාණන් වහන්සේගෙන් ඇසූවිට, ලබාදුන් පිළිතුර වූයේ,
1. සිත එකඟ කරගැනිම හා ධර්මය පිළිබඳව සැකය දුරු කිරීමයි.
2. ධර්මය ශ්‍රවණය කිරීම හා සිල්වත්ව විසීමයි.
3. දානය ආදී මහා පිංකම් කිරීම හා සිල්වත්ව විසීමයි.
4. මල් පළතුරු උයන්වතු ආදිය වැවීම සහ සිල්වත්ව විසීමයි.

38) තපස්සු භල්ලුක වෙළෙඳුන් දෙදෙනා බුදුරජාණන් වහන්සේගෙන් කේශධාතු රැගෙන පැමිණ, ඒවා නිධන් කොට තැනූ ස්තූපය ලෙස සැලකෙන්නේ,
1. මහියංගන ස්තූපයයි.
2. ත්‍රිකුණාමලයේ ගිරිහඬු සෑයයි.
3. ථූපාරාම දාගැබයි.
4. මිරිසවැටිය දාගැබයි.

39) පුද්ගලයෙකුගේ පිරිහීමට හේතුවන කරුණු දැක්වීමෙන් දේශනා කරන ලද සූත්‍ර ධර්මය වන්නේ,
1. පරාභව සූත්‍රයයි.
2. මිගසාල සූත්‍රයයි.
3. අණන සූත්‍රයයි.
4. දෝණපාක සූත්‍රයයි.

40) බෝධි වෘක්ෂයේ ආරක්ෂාවට නිමකර ඇති පියසක් සහිත මණ්ඩපය බෝධිඝරය ලෙස හඳුන්වන අතර, දැනට කලාත්මක බවින් උසස් බෝධිඝරයක් හමුව ඇත්තේ,
1. වැල්ලවායේ බුදුරුවගල.
2. පොළොන්නරුව ගල් විහාරයෙනි.
3. මාතලේ අලුවිහාරයෙනි.
4. කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්ගම

* * * * * *


(5) WWW.PastPapers.WiKi (4)
Download Term Test Papers, Short Notes From One Place!

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 15 S II

නම: ..........................................

# බුද්ධ ධර්මය

කාලය පැය දෙකයි

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20කද, තෝරාගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින්ද හිමිවේ.

01) i. සුද්ධෝදන රජතුමා විසින් සිදුහත් කුමාරයාට වාසය කිරීමට ඉදිකර දුන් මාලිගා තුන නම් කරන්න.
ii. '' කය නම් අසාරය භව නම් භයංකාරය මෙම පද්‍ය ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
iii. භාවේති කුසල ධම්මේහි ආසේවති වඩ්ඪේති ඒතායතාති භාවනා'' මෙහි තේරුම ලියන්න.
iv. විනය පිටකයට අයත් ග්‍රන්ථ වලින් දෙකක් නම් කරන්න.
v. ''වණ්ණුපථ '' ජාතකයෙන් ප්‍රකට වන්නේ අප මහා බෝසතාණන් වහන්සේ කිනම් පාරමිතාවක් සම්පූර්ණ කළ ආකාරය ද?
vi. ''අනවජ්ජ සුඛය '' යන්න කෙටියෙන් අර්ථ දක්වන්න.
vii. සතර බ්‍රහ්ම විහරණ නම් කරන්න.
viii. '' සිංහලයිනි නිගිටිව් බුද්ධ ගයාව බේරාගනිව්'' මෙම ප්‍රකාශය ඉදිරිපත් කළ ශ්‍රේෂ්ඨ නායකයා කවුද?
ix. බුද්ධ ප්‍රතිමා කලාවේ ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙන ආසන තුන නම් කරන්න.
x. ශ්‍රද්ධාවේ ප්‍රභේද දෙක නම් කරන්න.

02) i. පාරමිතාවක දක්නට ලැබෙන ප්‍රභේද තුන නම් කරන්න.
ii. බෝසතාණන් වහන්සේ දාන පරමිතාව ප්‍රගුණ කළ ආකාරය පැහැදිලි කරන්න.
iii. යහපත් ආදර්ශ ඇති සමාජයක් ගොඩනැංවීම සඳහා පාරමිතා ධර්ම ඉවහල් කරගන්නා ආකාරය පහදා දෙන්න.

03) i. '' සුකරානි අසාධූනි'' යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.
ii. එම ගාථාවේ අර්ථය ලියන්න.
iii. අයහපත් අවැඩදායි කටයුතු වලින් ඈත්වී යහපත් වැඩදායි පුද්ගල ජීවිත ගත කිරීමට ධම්මපදයෙන් ලබාදෙන උපදෙස් අගය කරන්න.

04) i. චතුරාර්ය සත්‍යය ඇසුරෙන් දෙකක් නම් කරන්න.
ii. ඉහත (I) හි නම් කරන ලද එක් කරුණක් පැහැදිලි කරන්න.
iii. යහපත් සමාජ ජීවිතයක් ගොඩනංවා ගැනීමට මධ්‍යම ප්‍රතිපදාව ඉවහල් කරගත හැකි ආකාරය පහදන්න.

05) i. පළමුවන ධර්ම සංගායනාව පැවැත්වීම බලපෑ හේතු මොනවාද?
ii. එම සංගායනාව පැවැත්වූ ස්ථානය, අනුග්‍රහය ලබාදුන් රාජ්‍ය පාලකයා, මූලිකත්වය ගෙන ක්‍රියාකල මහරහතන් වහන්සේ නම් කරන්න.
iii. ධර්ම විනය දෙකෙහි සුරක්ෂිත බව ඇතිකරලීමට මෙම සංගායනාවෙන් ගත් ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.

06) i. ස්තූප ආකෘති හයෙන් දෙකක් නම් කරන්න.
ii. ස්තූපයක රූප සටහනක් ඇද එහි කොටස් නම් කරන්න.
iii. මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලංකාවේ හෙළ කලාව සීග්‍රයෙන් වර්ධනය විය. අගයන්න.

07) පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට පමණක් කෙටි පිළිතුරු සපයන්න.
i. දුටුගැමුණු මහරජතුමා
ii. සතර සංග්‍රහ වස්තු
iii. දුමින්දාගමනය
iv. ආරක්ඛ සම්පදා

*******



PAST PAPERS WIKI
(5) WwW.PastPapers.WiKi (5)
Download Term Test Papers, Short Notes From One Place!

## බුද්ධ ධර්මය I පිළිතුරු පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. 2 | 2. 3 | 3. 1 | 4. 4 | 5. 2 | 6. 1 | 7. 3 | 8. 4 |
| 9. 2 | 10. 3 | 11. 1 | 12. 4 | 13. 3 | 14. 2 | 15. 1 | 16. 4 |
| 17. 3 | 18. 2 | 19. 3 | 20. 1 | 21. 4 | 22. 2 | 23. 3 | 24. 1 |
| 25. 4 | 26. 2 | 27. 3 | 28. 1 | 29. 1 | 30. 3 | 31. 2 | 32. 4 |
| 33. 1 | 34. 3 | 35. 2 | 36. 4 | 37. 4 | 38. 2 | 39. 1 | 40. 4 |

1 x 40 = 40

## බුද්ධ ධර්මය II පිළිතුරු පත්‍රය

01) i. රම්‍ය,සුරම්‍ය, සුභ

ii. කය නම් අසාරය - භව නම් භයංකාරය
කියනුව දිවා රෑය - කෙරෙම් බුදුගුණ අලංකාරය

iii. " කුසල් දහම් වැඩි දියුණු කිරීමේ මානසික අභ්‍යාසය භාවනාවයි. "

iv. පාරාජිකා පාලි, පාචිත්ත පාලි, චුල්ල වග්ග පාලි, මහා වග්ග පාලි, පරිවාර පාලි

v. වීර්ය පාරමිතාව

vi. නිවැරදි කාය කර්ම, වචී කර්ම, මනෝ කර්මයෙන් යුතුව ක්‍රියාකිරීම

vii. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා

viii. අනගාරික ධර්මපාලතුමා

ix. වීරාසන, භද්‍රාසන, පද්මාසන

x. ආකාරවතී ශ්‍රද්ධාව, අමූලිකා ශ්‍රද්ධාව

2 x 10 = 20

02) i. පාරමි, උපපාරමි, පරමත්ථ පාරමි.

ii. බෝසතාණන් වහන්සේ වෙසන්තර ජාතකයෙන් දාන පාරමිතාව පාරමී වශයෙන්ද සිවි ජාතකයෙන් දාන පාරමිතාවද, යස ජාතකයෙන් ජීවිතයම දන්දී දාන පරමත්ථ පාරමිතාව පූර්ණය කරයි.

iii. පාරමිතාවන් යහපත් සමාජයක් ගොඩනැගීමේදී මනාවූ පිටුවහලක් ලබාදේ. **දාන පාරමිතාව** : ලෝභයෙන් තොරව එකිනෙකාට පරිත්‍යාගශීලිවීමෙන්ද, අසරණ අයට ඇඳුම්පැළඳුම් ආහාර ආදිය බෙදාහදා ගැනීමෙන්ද, **සීලපාරමිතාව** : කය වචනය සංවර කරගැනීමෙන් ජීවිත හානි වැලකීම මෙන්ම පවුල් අතර ආරවුල් ඇතිනොවේ. අන්සතු දේවල්ද ආරක්ෂා වේ. **නෙක්ඛම්ම පාරමිතාව** : පසිඳුරන් සංවර කරගැනීමෙන් අසීමිත ආශාවන්ගෙන් තොරව ජීවත්විය හැකි වේ. **ප්‍රඥා** හෙවත් තැනට සුදුසු නුවණ සමාජයක ජීවත්වීමේදී තිබිය යුතුය. **වීර්යය** : උත්සහවන්ත බව තුළින් තමන් දියුණු වන්නා සේම අන් අය ඉදිරියේදී ජයග්‍රාහී බව මෙන්ම කීර්ති ප්‍රසංසාවට ලක්වේ. **සත්‍යගරුක** වීමෙන් සමාජයේ ක්‍රියාශීලි පුද්ගලයෙකු බවට පත්විය හැකිවේ. **ඛන්ති** හෙවත් ඉවසීම අපට සමාජයක ජීවත්වීමේදී තිබිය යුතුමය. **අධිෂ්ඨානය** හෙවත් එක් අරමුණක් වෙනුවෙන් කැපවී ක්‍රියාකිරීමෙන් ජීවිතය සාර්ථක කරගත හැකිය. **මෙත්තා** හෙවත් මිත්‍රත්වය තුළින් මනා සබඳතාවයක් ගොඩනගාගත හැකිය. **උපේක්ඛා** හෙවත් මධ්‍යස්ථව සිටීම තුළින් අපට සදාචාරවත් සමාජයක් ගොඩනගා ගත හැකිය.

2 + 3 + 5 = 10

03) i. සුකරානි අසාධූනි - අත්තානෝ අහිතානිච
යං වේ හිතංච සාධුංච - තං වේ පරමදුක්කරං

ii. තමාට අහිත වූ අයහපත් දේ කිරීම ඉතා පහසුය. යම් දෙයක් තමාට වැඩදායකද යහපත පිණිස පවතීද එවැනි දේ කිරීම අපහසුය.

iii. බෞද්ධයාගේ අත්පොත හෙවත් හස්තසාර ග්‍රන්ථයක් වන ධම්ම පදය සූත්‍ර පිටකයෙහි කුද්ධක නිකායට අයත්ය. ගාථා 423ක්, වග්ග 26ක්, නිධාන කතා 299කින් යුතු මෙය අධ්‍යයනය කිරීමෙන් යහපත් දේ කිරීමටත් යහපත් පුරවැසියන් වීමටත් මනා වූ පිටුවහලක් ලැබේ. (ධම්මපදයේ සඳහන් ගාථා අතුරෙන් තුනක්වත් උදාහරණ සහිතව විස්තර කළ යුතුය.)

2 + 3 + 5 = 10

04) i. දුක්ඛ ආර්යය සත්‍යය, දුක්ඛ සමුදය ආර්යය සත්‍යය, දුක්ඛ නිරෝධ ආර්යය සත්‍යය, දුක්ඛ නිරෝධගාමිණී පටිපදා ආර්යය සත්‍යය

ii. **දුක්ඛ ආර්යය සත්‍යය** : එදිනෙදා ජීවිතයේ ඇතිවන කායික මානසික දුක්ය. එය අටවැදෑරුම්ය. ඉපදීම (ජාති), වයසට යෑම (ජරා), ලෙඩවීම (ව්‍යාධි), මරණය, අප්‍රියයන් හා එක්වීම, ප්‍රියයන්ගෙන් වෙන්වීම, කැමති දේ නොලැබීම, පංචඋපාධානස්කන්ධයම දුකකි.

**දුක්ඛ සමුදය ආර්යය සත්‍යය** : දුකට හේතුවයි. එනම් තණ්හාවයි. එය ත්‍රිවිධාකාරය, කාමතණ්හා, භව තණ්හා, විභව තණ්හා.

**දුක්ඛ නිරෝධ ආර්යය සත්‍යය** : දුකට හේතුව වූ තණ්හාව නැතිකිරීමයි. ගසක් කැපීමේදී සහමුලින්ම කපා දමන්නා සේ තණ්හාවද සහමුලින්ම නැතිකළ යුතුය. **දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්යය සත්‍යය** : දුක නැතිකිරීමේ මාර්ගයයි. මධ්‍යම ප්‍රතිපදාව මැදුම්පිළිවෙත හෙවත් ආර්යය අෂ්ඨාංගික මාර්ගයයි. (ආර්යය අෂ්ඨාංගක මාර්ගය කෙටියෙන් විස්තර කරන්න.)

iii. චතුරාර්ය සත්‍යය අතරින් දුක්ඛ නිරෝධගාමිණී පටිපදා ආර්ය සත්‍යය මධ්‍යම ප්‍රතිපදාව හෙවත් ආර්යය අෂ්ඨාංගික මාර්ගයයි. එය අංග අටකි. සම්මා දිට්ඨි, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම,සම්මා සති, සම්මා සමාධි යන්නයි. මෙම අංග අට එකිනෙක යහපත් සමාජයක් ගොඩනැගීමට උපකාර වන අන්දම විස්තර කළ යුතුය. උදා : සම්මා ආජීව : නිවැරදි රැකියාවයි. පංචවිධ වෙළඳාමෙන් බැහැර වීමෙන් ප්‍රාණඝාතය සිදුනොවේ. කළකෝලහල සිදුනොවේ. කෘෂිකර්මය, රාජ්‍ය සේවය ආදී නිවැරදි යහපත් රැකියා කළ යුතුය. 2 + 3 + 5 = 10

05) i. සුභද්‍ර භික්ෂුවගේ නුසුදුසු ප්‍රකාශය. (ඇවැත්නි ශෝක නොවන්න, නොවැලපෙන්න, ඒ මහා ශ්‍රමණයාගෙන් අප මිදුණෙමු. මෙය කැපය, මෙය අකැපය කීමට කිසිවෙකු නැත. අපට කැමති දෙයක් කළ හැක.)

- ඡන්න භික්ෂුවට බ්‍රහ්ම දණ්ඩය පැනවීම. • ආනන්ද හිමිට එල්ලවූ චෝදනා වලින් නිදහස්වීම.

ii. ස්ථානය : රජගහ නුවර වේභාර පර්වතය අසල සප්තපර්ණී ගුහාව, අනුග්‍රහය : අජාසත්ත රජු, මූලිකත්වය මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ.

iii. පළමු ධර්ම සංගායනාව බුද්ධ පරිණිර්වාණයෙන් තෙමසකට පසු සප්තපර්ණී ගුහාවෙහි අජාසත්ත රජුගේ අනුග්‍රහයෙන් මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ මූලිකත්වයෙන් භික්ෂූන් පන්සියයකගේ සහභාගීත්වයෙන් මාස 07ක් පැවැත්වීමෙන්පසු ධර්ම විනය සුරක්ෂිත කිරීමෙහිලා වැදගත් තීරණ රැසක් ගත්හ.

- සූත්‍ර හා විනය පිටකය සම්පූර්ණ කර භාණක පරම්පරා වලට පැවරීම.

සූත්‍ර පිටකය : දීඝ නිකාය : ආනන්ද මහ රහතන් වහන්සේගේ ශිෂ්‍යය පරපුරට.
මජ්ඣිම නිකාය : සැරියුත් මහ රහතන් වහන්සේගේ ශිෂ්‍ය පරපුරට.
සංයුක්ත නිකාය : මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ ශිෂ්‍ය පරපුරට.
අංගුත්තර නිකාය : අනුරුද්ධ මහ රහතන් වහන්සේගේ ශිෂ්‍ය පරපුරට.
ඛුද්දක නිකාය : සියලුම භික්ෂූන්ට
විනය පිටකය : මහාවග්ග පාලි, චුල්ලවග්ග පාලි, පාරාජිකා පාලි, පරිවාර පාලි, පාචිත්තිය පාලි උපාලි මහ රහතන් වහන්සේගේ ශිෂ්‍ය පරපුරට පැවරිණි.

- විසිරී තිබූ ධර්මය ඒකරාශී කර එක සම්මුතියකට ගෙන ඒම.
- නොපැණවූ නොපැණවීම මෙන්ම පැනවූ නිති රැකගැනීම මෙන්ම ආනන්ද හිමිට එල්ල වූ චෝදනා වලින් නිදහස්වීම සිදුවිය.

2 + 3 + 5 = 10

06)

i. බුබ්බුලාකාර, ඝටාකාර, ඝණ්ඨාකාර, ධාන්‍යාකාර, පද්මාකාර, ආමලාකාකාර

ii




iii. මහින්දාගමනය පොසොන් පොහෝ දින මිහින්තලේ අමස්තල දී මිහිඳු මහරහතන් වහන්සේ සහ දෙවන පෑ තිස් රජු හමුවීමත් තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙසින් සිදුවිය. මහින්දාගමනයෙන් පසු ප්‍රාග් බෞද්ධ නව ඇදහිලි වලට නව අර්ථකථනයක් සිදුවිය. පර්වත වන්දනය වෙනුවට ස්තූප වන්දනය, දේව වන්දනය වෙනුවට දෙවියන්ට පින් අනුමෝදනා කරවීම, මළවුන්ට පින් අනුමෝදනා කරවීම ආදිය සිදුවිය. එමෙන්ම ත්‍රිවිධ චෛත්‍ය හා බැඳුණු චෛතියඝර, වාහල්කඩ, බෝධිඝර, ප්‍රතිමාඝාර මුරගල, කොරවග්ගල, සඳකඩ පහන ආදී කලා නිර්මාණ ලැබිණි. සිංහල අක්ෂර මාලාවක් මෙන්ම සිංහල සාහිත්‍යය ලැබිණි. වැවයි පන්සලයි,ගමයි දාගැබයි යන සංකල්පය මෙන්ම වැඩිහිටියන්ට ගරුකිරීම, ගුරුවරුන්ට කීකරුවීම ආදී

2 + 3 + 5 = 10


(3) WWW.PastPapers.WiKi (2)
Download Term Test Papers, Short Notes From One Place!

ගුණධර්ම දායාද විය. බුදුදහම පදනම් කරගත් චිත්‍ර කලාවක්ද, දායාද විය. රාජ්‍ය පාලකයෙකුට පාලනය ගෙනයාමේදී බෞද්ධ උපදෙස් දස සක්විති වත් දසරාජ ධර්ම සතර සංග්‍රහ වස්තු ආදී උපදේශනයන් ලැබිණි.

07)

i. අනගාරික ධර්මපාලතුමා.

1864 සැප්තැම්බර් 17 දොන්ඩේවිඩ් හේවාවිතාරණ නමින් ඉපදිණි. පියා දොන් කරෝලිස් හේවාවිතාරණ, මව මල්ලිකා හේවාවිතාරණ විය. බැප්ටිස් සාන්ත බෙනඩික් විද්‍යාලයෙන් ක්‍රිස්තියානි දහම හැදෑරිය. ඕල්කට්තුමා සමගින් එක්ව බුදුදහම නගාසිටුවීමට කටයුතු කලේය. පරමවිඥානාර්ථ සමාගම, සරසවි, සඳරැස ආදී පුවත්පත් ඇරඹීය. ඩේවිඩ් නාමය අතහැර ධර්මපාල යන බෞද්ධ නාමය භාවිතා කලේය.
තම රථයේ ගෙරිමස් නොකනු ලෙස සටහන් කලේය. බෞද්ධ පාසල් පිහටුවීමට පුරෝගාමී විය. සිංහලයිනි නැගිටිව් බුද්ධ ගයාව බේරාගනිව් යනුවෙන් ප්‍රකාශ කර බුද්ධගයාව බේරාගැනිමට කටයුතු කලේය. මූලගන්ධකුටි විහාරයේදී සිරි දේවමිත්ත ධර්මපාල නමින් පැවිදි විය. " සම්බුදු සසුන බේරාගැනිමට තවත් විසිපස් වසරක් දඹදිව ඉපදේවා යන අදිටනින් අපවත් විය.

ii. සතර සංග්‍රහ වස්තු

සතර සංග්‍රහ වස්තු සිගලෝවාද සූත්‍රයෙහි සඳහන්ය. දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාවය යනු ඒවාය. දානය යනු නිර්ලෝභීව පරිත්‍යාග කිරීමය. ප්‍රියවචනය යනු බොරුකීම, කේලාම්, හිස්වචන, පරුෂ වචන කීමෙන් බැහැරව අනුන් සමගි කරවන යහපත් වචන කතා කිරීමය. අර්ථ චර්යාව යනු අන් අයගේ දියුණුවට වැඩ කිරීමය. සමානාත්ම තාවය යනු ජාති ආගම් කුළභේදවලින් තොරව සැමොම එක හා සමානව සැලකීමයි. සතර සංග්‍රහ වස්තු රාජ්‍ය පාලනයට මෙන්ම සහජීවනයෙන් සිටිමේදී වැදගත් උපදේශනයන් වේ.

iii. දූමින්දාගමනය

දූමින්දාගමනය යනු සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහාබෝධි ශාඛාව රැගෙන වැඩමවීමයි. මෙය උඳුවප්පොහෝදින දඹකොළපටුන වරායට ගොඩබැසීමෙන් සිදුවිය. දූමින්දාගමනය නිසා මෙරට භික්ෂුණී සාසනය ඇරඹිණි. අනුලා බිසව පැවිදිවීමෙන් භික්ෂුණී සාසනය ඇරඹිණි. ශ්‍රී මහාබෝධීන් වහන්සේ රෝපණය කිරීම නිසා බෝධි පූජා ආරම්භ විණි. ශිල්ප ශ්‍රේණි 18කට අයත් පවුල් 1800ක ජනයා මෙරටට පැමිණියහ. කලාශිල්ප පෝෂණය විය.

iv. ආරක්ඛ සම්පදා

ව්‍යග්ගපජ්ජ සූත්‍රයෙහි පුද්ගලයෙකුගේ මෙලොව දියුණුවට හේතුවන කරුණු අතර ආරක්ඛ සම්පදා යනු ධාර්මිකව ඉපැයූ ධනය විනාශ වන ක්‍රම හතරකින් ආරක්ෂා කරගැනීමයි. එනම්, රජයට අයත්වීම, සොරුන්, ගින්නෙන්, ජලයෙන් යන මෙම ක්‍රමවලින් ධනය රැකගැනීම ආරක්ඛ සම්පදා නම්වේ.

5 + 5 = 10

PAST PAPERS WIKI



(3) www.PastPapers.WiKi (3)
Download Term Test Papers, Short Notes From One Place!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න